පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.16 පැය 0850 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out / 747 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීමක් සම්බන්ධ තොරතුරු</u>

## 01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කන්තලේ පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.

2025.04.16 වන දින අළුයම් කාලයේ වාන්ඇල පොලිස් වසමේ පන්සල්ගොඩැල්ල ප්‍රදේශයේදී කන්තලේ පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 01 මිලි ග්‍රෑම් 250 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන වාකරේ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 30 ක් වන කන්තලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කන්තලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. නීති විරෝධී මත්පැන් හා ගෝඩා සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර.

2025.04.15 වන දින සවස් කාලයේ කුච්චවේලි පොලිස් වසමේ වාලයෙත්තු සින්නකරච්චි කලපුවේදී පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 02 ක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 35 ක්, තඹ දඟරයක් සමඟ සැකකරුවෙකු හා නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 373 මිලි ලීටර් 500 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කුච්චවේලි පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 50 හා 52 වයස්වල පසුවන නිලාවේලි, කෝපාලපුරම් ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කුච්චවේලි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

මෙම වැටලීමට අදාල ඡායාරූප හා වීඩියෝ මේ සමඟ යොමු කරමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**